᭞

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,741 — 1959 මැයි 8 වැනි සිකුරාදා—8.5.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 1071 | තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1073 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 1073 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 1092 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 1095 | විවිධ දැන්වීම් ... ... ... | 1095 |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායයී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට $7\frac{1}{2}$කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙසු සැන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද, එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට ඉද, ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ සථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාතීමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුද හැරීමට තමන් සූදනම් ව සිටිත් ද, නැද්ද ' යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපෙක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ආධුනික සැලසුම්කරුවන්ගේ (*Apprentice Draughtsmen*) තනතුරු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරුවන්ගේ තනතුරු සඳහා පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම් පත් වර්ෂ 1959 මැයි 29 වැනි දින හෝ ඊට පෙර භාර ගනු ලැබේ.

2. **වැටුප්ක්‍රමය හා සේවා කොන්දේසි :**

(1) ආධුනික සැලසුම්කරුගේ තනතුර තාවකාලිකය. වාර්ෂික වැටුප් රු. 960 න් පටන් ගෙන දෙවර්ෂයක් අවුරුදු පතා රු. 72 බැගින් වැඩිවී රු. 1,104 න් අවසන් වේ. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන දෙවැනි පන්තියේ සැලසුම්කරුවන් තේරීමේ පරීක්ෂණයෙන් සමර්ථවුවහොත් පමණක් ඔව්හු රු. 1,260—120 × 21—රු. 3,780 වාර්ෂික පඩි ක්‍රමයට දෙවැනි පන්තියේ සැලසුම්කරුවන් වශයෙන් පත්වීමට සුදුසුකම් ඇත්තෝ වන්නාහ.

(2) ආධුනික සැලසුම්කරුවන්ගේ පාඨමාලාව අවුරුදු 3 කින් අවසන් වෙයි. ඔව්හු පළමුවන අවුරුද්දේදී වාර්මාගී දෙපාතීමේන්තුව මගින් පිළියෙල කරනු ලබන ප්ලෑන් ඇඳීම පිළිබඳ පාඨමාලාව සම්පූර්ණ කළයුතුය. සාර්ථක ලෙස පාඨමාලාව සම්පූර්ණකළ ඉක්බිති වැඩිපුර පුහුණුව සඳහා දෙපාතීමේන්තුවේ චිත්‍ර ඇඳීමේ කාර්යාලයන් වෙත යවනු ලැබේ.

(3) තෝරාගන්නාලද අයදුම්කරුවන් වාරිමාගී දෙපාර්තමේන්තුවේ දෙවැනි පන්තියේ සැලසුම්කරුවන් ලෙස සුදුසුකම් ඇත්තන් වීම සඳහා තමන්ගේ පාඩම් නොකඩවා නිවැරදි ලෙස කරගෙන යන බවටත් පුහුණුව අවසන්වූ පසු එසේ අවශ්‍ය වුවහොත් දෙපාර්තමේන්තුවේ දෙවැනි පන්තියේ සැලසුම්කරුවන් වශයෙන් අවුරුදු පහකට අඩු නොවන කාලයක් සේවය කරන බවටත් දෙපාර්තමේන්තුවත් සමග පොරොන්දුවකට බැඳිය යුතුය. පුහුණුවන්නන්ගේ සේවා කොන්දේසි නියම ලෙස සම්පූර්ණ කිරීම සඳහා පුහුණුවන්නන්ටත්, ඔවුන්ගේ දෙමාපියන්ටත්, නිත්‍යානුකූල භාරකරුවන්ටත් ඇපකරුවන් දෙදෙනෙකු සහිත රු. 2,000 ක ඔප්පුවකට ඇතුල්වීමට සිදුවනවා ඇත.

(4) තෝරාගන්නා ලද අයදුම්කරුවන් අවසාන වශයෙන් පත්කර ගන්නට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකින් සමර්ථවිය යුතුය.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

සෑම අපෙක්ෂකයෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

(අ) 1959-5-29 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩුවීම හා අවුරුදු 25 ට නොවැඩි බව.

(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත බව.

(ඉ) ගණිතය විෂයයක් වශයෙන් ගෙන සාමාර්ථය ලබා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමර්ථය ලබා ඇති බව.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොව) ඇමිණිය යුතුයි:—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික පත්‍රය.

(ආ) උප්පැන්න සහතිකය (සැ. යු. බව්තිස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරන ලද සහතිකපත් භාරගනු නොලැබේ).

(ඉ) තම සුදුසුකම් හා චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක්.

**සටහන:** මෙම සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.

5. අයැදුම්කරුවන් කොළඹදී මේ සම්බන්ධයෙන් පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණිය යුතුයි. මේ සඳහා ගමන් වියදම් අයදුම්කරුවන් විසින්ම දැරීමට සිදුවනවා ඇත.

6. රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම් පිළිබඳ පොදු කොන්දේසි මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ මුල පලවී ඇති වැඩි විස්තරයන්ගෙන් දැනගත හැකිය.

නි. විජේවර්ධන,
වාරිමාගී අධ්‍යක්ෂක වෙනුවට.

වාරිමාගී දෙපාර්තමේන්තුව,
නැ. පෙ. 500,
කොළඹ 1.
දිනය : 1959.4.29.

### වාරිමාගී දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරුවන්ගේ (*Apprentice Draughtsmen*) තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රයයි

වාරිමාගී අධ්‍යක්ෂකතුමා,
කොළඹ.

(1) සම්පූර්ණ නම:—
   (අ) පෙළපත් නම :————.
   (ආ) අනිකුත් නම් :————.

(2) ලිපිනය :————.

(3) ජාතිය :————.

(4) උපන් දිනය හා ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

(5) විවාහකද, අවිවාහකද යන වග :————.

(6) සමර්ථවූ විභාග, සම්මාන ලත් විෂයයන් සහිත අධ්‍යාපන සුදුසුකම් :————.

(7) පාසැලින් අස්වූද සිට කරණ ලද රක්ෂාවන් ගැන විස්තරය: ————.

(8) දැනට රක්ෂාවක් ඇතොත් ඒ පිළිබඳ විස්තරය :————.

(9) චරිත සහතික එවනු ලබන්නේ කාගෙන්ද යන වග :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති කරුණු සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

ස්ථානය :————.
දිනය :————.

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### බාහිර උපදේශක තනතුරු-කනිෂ්ඨ කාර්මික විද්‍යාලය, ගාල්ල.

ගාල්ලේ කනිෂ්ඨ කාර්මික පාඨශාලාවේ බාහිර උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර බාරගනු ලැබේ. 1959 මැයි මස 23 වැනි දින හෝ ඊට පෙර, ගාල්ලේ කනිෂ්ඨ කාර්මික පාඨශාලාවේ විද්‍යාලයාධිපති තැන වෙත ලැබෙන සේ සියළුම ඉල්ලුම් පත්‍ර යැවිය යුතුයි. අපේක්ෂක යන් විසින් තමන්ගේ අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් හා තමන්ගේ පලපුරුද්ද පිළිබඳව සියළු විස්තර සඳහන් කළ යුතුයි.

**තනතුරු:**

ලඝු ලේඛනය සහ යතුරු ලියනය (ඉංග්‍රීසි)
යතුරු ලියනය (සිංහල)
ගණන් තැබීම
වාණිජ භූගෝල විද්‍යාව
සිංහල භාෂාව
ඉංග්‍රීසි භාෂාව.

බාහිර උපදේශකවරුන්ට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද අනුව වේ.

**රක්ෂාවේ කොන්දේසි:**

මෙම තනතුරු අවුරුද්දේ ජූනි මාසයෙන් පටන්ගෙන ඊලඟ අවුරුද්දේ මාර්තු මාසයෙන් අවසන්වන අධ්‍යයන වර්‍ෂයක් සඳහා වේ.

බාහිර උපදේශකවරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හිදී සහ අභ්‍යන්තර නොවූ පරීක්ෂකයන් නොයදවන වර්‍ෂාවසාන පරීක්ෂණ යන්හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පන්තිවල ශිෂ්‍ය යන් පරීක්ෂා කළ යුතුයි.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්‍ෂක.

1959 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ 10 යේ පිහිටි ලංකා කාර්මික
විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේදීය.

---

## පාරවල් ලකුණු කරන ඕවර්සියර් වරුන්ගේ තනතුරු (තාවකාලික)

බදුල්ල දිස්ත්‍රික්කයේ රජයේ සංවර්ධන ව්‍යාපාරයන්හි පාරවල් සෑදීමේ කටයුතුවල යෙදවීම පිණිස පාරවල් ලකුණු කරන ඕවර්සියර් වරුන් (තාවකාලික) දෙදෙනෙකු (2) ගේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර මවිසින් භාරගනු ලැබේ.

මේ තනතුරු තාවකාලික හා විශ්‍රාම වැටුප් රහිත වන අතර අවශ්‍ය වුවහොත් එම තනතුරු දරන්නන් මාරු කිරීමටද ඉඩ තිබේ.

මේ තනතුර සඳහා මුල් හයමාසයේදී දවසකට රුපියල් 2.10—12—3.18 දක්වා දවස් පඩිද ඉන්පසු අවුරුද්දකට රුපියල් 750—42—රුපියල් 1,086 දක්වා මාස් පඩිද ගෙවනු ලැබේ.

අයදුම්කරුවන් වයස 20ටත් 32ටත් අතර ලාංකිකයන් විය යුතුයි.

අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් :—

ගණිතය එක් විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා සිටිය යුතුයි. මෙම විභාගයේදී ගණිතයෙන් සම්මාන සාමාර්ථයක් ලබා ඇති අයදුම්කරුවන් ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ. අවශ්‍යවුවහොත් රජය විසින් පිළිගත් ක්‍රමයක් අනුව රජයෙන් නියම කරන මුදලක් ඇප වශයෙන් සැපයීමට තෝරාගත් අයදුම්කරුවන් සූදානම් වී සිටිය යුතුයි.

සෑම ඉල්ලුම් පත්‍රයක්ම අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය, වයස, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්, දැනට කරන රක්ෂාව (රක්ෂාවක යෙදී සිටිනම්) හා එහි පඩිය ආදී වශයෙන් සම්පූර්ණ විස්තරයක් ඇතිව මෑතකදී ලබාගත් චරිතය පිළිබඳ සහතික දෙක (2)ක පිටපත් සමඟ ඉදිරිපත් කළයුතුයි.

ඉල්ලුම්පත්‍ර "දිසාපති තැන, බදුල්ල" යන ලිපිනයට 1959. 5. 26 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන්නට සැළැස්විය යුතුයි.

ඇන්. ඩී. ජයවීර,
බදුල්ලේ දිසාපති වෙනුවට.

1959 අප්‍රේල් මස 25 වැනි දින,
බදුල්ල කච්චේරියේ දීය.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

මගේ අංකය: ඊබීඒ. 35/57 (II)
1959 මැයි මස 2 වැනි දින,
කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ
කාර්යාලයේ දීය.

## ආරෝග්‍යශාලා ලිපිකරු සේවා විභාගය—මාර්තු 1958

1958 නොවැම්බර් මස 14 වැනි දින නිකුත් කරන ලද අංක 11,584 දරන ගැසට් පත්‍රයෙහි පළවූ, 1958 නොවැම්බර් මස 8 වැනි දින දරන නිවේදනයට සහ 1959 අප්‍රේල් මස 9 වැනි දින නිකුත් කරන ලද අංක 11,721 දරන ගැසට් පත්‍රයෙහි පළවූ 1959 මාර්තු මස 31 දින දරන නිවේදනයට එක්කිරීම සඳහා පහත නම් සඳහන් අයදුම්කරු වන් ද 1958 මාර්තු මස පැවැත්වූ ආරෝග්‍යශාලා ලිපිකරු සේවා විභාගයේ ප්‍රතිඵල අනුව ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ II වැනි පන්තියට පත්කිරීම සඳහා තෝරාගන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | ලිපිනය |
|---|---|---|
| ඩී. එම්. එලාරිස් අප්පු | — | අලකොළගොල්ල, හැතැක්ම, හාලිඇල. |
| ජී. ජී. ඇස්. ගුණසේකර | — | බාගතුඹුව, ගිනිගත්හේන. |
| කේ. ආර්. ප්‍රේමදාස | — | වැල්ල පාර, කොස්ගහදූව වත්ත, ගෝනාපීනුවල. |
| ඇන්. පී. පියදාස | — | අපරැක්ක, දියගහ, මාතර (හරහ) |
| ඇස්. ඩබ්ලිව්. පියතිලක | — | අමුගොඩ, පිටිගල. |
| එච්. ඒ. රණසිංහ | — | පී. යූ. හුරීකඩුව. |
| ඇස්. රත්නපුලිගේ | — | ඒ. එච්. ගුණසේකර බාජේ, මැදිවිදුහල, නාරම්මල. |
| ඇස්. ටී. සිරිසේන | — | ලී ගබඩාව, බීදුනුවැව, බණ්ඩාර වෙල. |
| ඩබ්ලිව්. කේ. සෝමපාල | — | 63, බත්ගම්ගොඩ, පැල්මඩුල්ල. |
| ටී. ඇස්. සලමොන් | — | කිතලහිටියාව, යක්විල. (ඇන්. ඩබ්ලිව්. පී.) |

2. අයදුම්කරුවන්ට වහාම පත්වීම් දීමට ආණ්ඩුව බැඳී නැත. එහෙත් පුරප්පාඩු ඇතිවන අන්දමට පත්වීම් දෙනු ලැබේ. සෑම පත්වීමක්ම දෙනු ලබන්නේ තුන් වසක සෝදිසි කාලයක් උඩ ය. වෛද්‍ය පරීක්ෂණයකට පෙනීසිටිය යුතු ඔවුහු ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ කොන්දේසිවලට ද යටත් වන්නාහ.

ඩබ්ලිව්. ඒ. කරුණාරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1) ස්ටේෂන් වැගන් රථ දෙකක් සැපයීම සඳහා 1959 මැයි 26 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැන ගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 මැයි 25 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 මැයි 8 වැනි දින,
කොළඹදීය.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය ICA ටැන්ඩර් දැන්වීමයි

1959 පෙබරවාරි 27 වැනි දින අංක 11,680 හා 1959 අප්‍රේල් 24 වැනි දින අංක 11,729 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල සඳහන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ඩම් ට්‍රක් රථ (ටැන්ඩර් අංක 216) සැපයීම සඳහා වූ ටැන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1959 ජූනි 10 වැනි දින පෙරවරු 9.30 දක්වා කල් දමන ලද බව කරුණාවෙන් සලකන්න.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 මැයි 5 වැනි දින,
කොළඹ 1.

---

## කෘෂිකම් දෙපාතීමේන්තුව

### වාතාශ්‍රය සහිත වී ගබඩා සෑදීම

1959 අප්‍රේල් මස 24. 4. 59 දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවැනි කොටසේ දෙවැනි ඡෙදයේ පළවුනු මගේ 17. 4. 59 දින දරණ දැන්වීම හා සම්බන්ධවයි. එහි සඳහන් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1959 ජූනි මස 5 වැනි සිකුරාද 2.30 වන සේ වෙනස් කරන ලදී.

ඇම්. ඇf්ජ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

යාන්ත්‍රික අංශය,
කෘෂිකම් දෙපාතීමේන්තුව,
ගන්නොරුව, පේරාදෙනිය,
1959 අප්‍රේල් 27 දා.

---

## කෘෂිකම් දෙපාතීමේන්තුව

### වැලිසර ගොවි උපකරණ කම්හලට අමතර කොටස් ඉදිකිරීම

1959 අප්‍රේල් මස 24. 4. 59 දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවැනි කොටසේ දෙවැනි ඡෙදයේ පළවුනු මගේ 17.4.59 වැනි දින දරණ දැන්වීම හා සම්බන්ධවයි.—එහි සඳහන් ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 1959 ජූනි මස 5 වැනි සිකුරාද පස්වරු 2.30 වන සේ වෙනස් කරන ලදී.

ඇම්. ඇf්ජ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

යාන්ත්‍රික අංශය,
කෘෂිකම් දෙපාතීමේන්තුව,
ගන්නොරුව, පේරාදෙනිය.
1959 අප්‍රේල් 27 දා.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### පොළොන්නරුවේ කෘෂිකම් මධ්‍යස්ථානයේ දුම්කොළ උඳුන් (බාන්ස්) දෙකක් සෑදීම

1959 මාර්තු 13 දින සහ අප්‍රේල් 3 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම් ගැනයි.

ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 1959 යේ මැයි මස 15 වෙනිද පස්වරු 2.30 දක්වා කල් දමන ලදී.

ඇම්. ඇf්ජ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ තැන.

1959 අප්‍රේල් මස 29 දින
පේරාදෙණියේදීය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### පොල් විකිණීම

කෑගල්ල රත්නපුර දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැන විසින් බටන්ගල, බැම්ණිවත්ත ආණ්ඩුවේ ගොවිපලවල්හි ඇති පොල් 3,980ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1959 මැයි මස 29 වැනිදින පස්වරු 2.30 වනතුරු භාරගනු ලැබේ.

2. කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැන ගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැන, කෘෂිකම් කායභිලය, රත්නපුර යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "බටන්ගල සහ බැම්ණිවත්ත ආණ්ඩුවේ ගොවිපලවල පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිට පතක්ද සහිතව සීල් තබන ලද කවරයක් තුළ බහා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "බටන්ගල සහ බැම්ණිවත්ත ආණ්ඩුවේ ගොවිපලවල පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

4. ලියා පදිංචිකළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ඒවා ලැබුන බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුන හොත් ඔහු කෑගල්ල සහ රතනපුර දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝරම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රු. 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගරයේ හෝ කළ යුතුයි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් දින දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත් කරගත යුතුයි. එසේ නොහැකිවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහු ගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ඩෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැණීමේත් බලය කෘෂිකම් අධ්‍යක්ෂ වෙත තබා ගනී.

9. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැණීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934ජ් 19 වැනි අංකය දරණ කම්කරු ආඥපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන්කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැණීමට නුසුදුසුයයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැණීම ගැන විරුඩවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැණීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්ෂ තැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මිල ගණන් යටත් පිරිසෙයින් සති 3 කටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත පොල් වලට ගෙවා ඉවත් කර ගත යුතුයි.

16. පිළිගත් ටෙන්ඩර්කරු පොල් සියල්ලටම සම්පූර්ණ මුදල ගෙවා ඉවත් කර ගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩදෙනු නොලැබේ.

17. මේ පිළිබඳ වැඩි විස්තර බටන්ගල සහ බැම්ණිවත්ත ආණ්ඩුවේ ගොවිපලවල් භාර ගොවිකම් උපදේශක වරුන්ගෙන් දැනගත හැක.

ආර්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ තැන.

1959 අප්‍රේල් මස 28 වෙනිදින
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### යාපනේ දිස්ත්‍රික්කයේ ගොවිපොළවලට කළුගල් ආදිය සැපයීම— ඒ ඒ තැන්වලට සැපයීම හා ගෙනැවිත් භාරදීම

යාපනේ කෘෂිකම් කායඹාලයේ පරිපාලන නිලධාරි තැන විසින්, පහත සඳහන් දේවල් සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 මැයි මස 26 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ :—

| | අඟල් ½ කළු ගල් කියුබ් | අඟල් ¾ කළු ගල්කියුබ් | අඟල් 4 සක්කගල් කියුබ් | අඟල් 6 සක්ක ගල් කියුබ් |
|---|---|---|---|---|
| තින්නවැලි ප්‍රායෝගික පාසැල | 4 | 4 | — | — |
| කිලිනොච්චිය ගොවිපොල | 18 | — | 15 | 3 |

2. යාපනේ කෘෂිකම් කායඹාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් 2ක් ලියුම් කවරයක දමා සීල් තබා " පරිපාලන නිලධාරි තැන, කෘෂිකම් කායඹාලය, යාපනේ " යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි. "යාපනේ දිස්ත්‍රික්කයේ ගොවිපොලවලට කළුගල් ආදිය සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් යාපනේ කෘෂිකම් කායඹාලයේ පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "යාපනේ දිස්ත්‍රික්කයේ ගොවිපොලවලට කළුගල් ආදිය සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු යාපනේ කෘෂිකම් කායඹාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී යාපනේ කෘෂිකම් කායඹාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකම් අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3 කටවත් වෙනස් නොවන සවිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකම් අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

12. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

13. කොන්ත්‍රාත් කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14.1934 ජේ, 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතුපිට කෘෂිකම් අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර යාපනේ කෘෂිකම් කායඹාලයේ පරිපාලන නිලධාරි තැන ගෙන් දැනගත හැක.

18. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරු ගිවිසුම් පත්‍රය අත්සන් කර මාස දෙකක් ඇතුළත මෙම කායඹය නිම කළ යුතුය.

ආර්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

1959 අප්‍රේල් මස 25 වැනිද,
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### අනුරාධපුර කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ විධායක නිලධාරිතැනට ගොඩනැගිලි උපකරණ සැපයීම

කොළඹ යුනියන් පෙදෙසේ, කෘෂිකම් හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1959 ජූනි 19 වැනි දින පස්වරු 2.30 වන තෙක් අනුරාධපුර කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ විධායක නිලධාරිතැනට පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ඉතා කිට්ටු වශයෙන් අඩි 80ක් දිග, අඩි 30ක් පළල සහ වඩිම්බුව ළඟට අඩි 12ක් උස පල දෙකේ වහලයක් ඇති, විවෘත මඩු තුනක්.

වහල කාප්ප, අට්ටාල බාල්ක (පර්ලිංස්), වැද්දීම් (බ්‍රෙසිංස්) පරාල, වැඹ (ගේඩර්) යන සියල්ලම වානේ විය යුතුයි.

පීලි සහිත ඇස්බැස්ටස් තහඩුවලින් වහල සෙවිලි කිරීම, සහ කුමේර වැහිමද වැහි වතුර බැස යන ඇස්බැස්ටස් පීලි සහ පහළ ජල කාලද සහිත විය යුතුයි.

සෑම ගොඩනැගිල්ලකම උභය පාර්ශවයෙහි බිත්තියේ සිට වඩිම්බුව දක්වා දිගටම අඩි 3ක පළල තිබිය යුතුයි. ගෙනවිත් බාර දීමට පෙර සෑම වානේ තහඩුවකම එක් වරක් සායම් (පේන්ට්) ගෑ යුතුයි.

මේවා අනුරාධපුර කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයට ගෙනවිත් භාර දීමට සහ ගොඩනැංවීමටත් ඉන්පසු එක් වරක් සායම් ගෑමටත් මිළ ගණන් වෙනම සඳහන් කළ යුතුයි.

වානේ වැඩ, ගොඩනැගිලි වානේ පිළිබඳ බ්‍රිතාන්‍ය සම්මුති විශේෂ විස්තරයන්හි අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුයි.

2. ෆෝර්ම කොළ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නොරුවේ ඉංජිනේරු වැඩපලේ පරිපාලන නිලධාරීතැනගෙන් ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පත්‍ර ලියා එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ඒ කවර යෙහි “ සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, යූනියන් පෙදෙස, කොළඹ ” යන්න ලියා එහි මුදුනේ වම් කෙළවරේ “ අනුරාධපුර කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයට ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩරය ” යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැති නම් ඒවා රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරීතැන වූ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට භාරදිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි “ අනුරාධපුර කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයට ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩරය ” යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4ක් ඇතුළත දී නො ලැබුණේ නම් ඒ ගැන කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩල යේ සභාපතිතැනගෙන් වහාම විමසිය යුතුයි.

5. මෙම ගොඩනැගිලි සඳහා රුපියල් 30,000කට වඩා ආණ්ඩුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් 1959 ජූනි 19 වැනි දින දවල් 12 වන තෙක් (සතියේ දිනයක පස්වරු 4 දක්වාද සෙනසුරාදා දිනයන්හි පස්වරු 12.30 දක්වාද) එක් ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියක හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ රුපියල් 100ක මුදලක් තැන්පත්කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනයක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති, කිසිම ටෙන්ඩර් පත්‍රයක් නියම ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් (Rates) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන්ම ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සනද තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් තමන්ගේ ලිපිනය ඉතා පැහැදිලි අකුරෙන් ලියා එවිය යුතුය.

8. ටෙන්ඩර්කරුවන් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන ඉංජිනේරුතැනගෙන් මේ ගොඩනැගිලි සම්බන්ධ ප්ලෑන, දිග, පළල යනාදිය සහ පොරොන්දු පත්‍ර පිළිබඳ වැඩි විස්තර ලබාගත යුතුයි. සෑම ටෙන්ඩරකරුවෙක්ම මේ ගොඩනැගිලි සෑදීමට අදහස් කරන ස්ථානය ප්‍රථමයෙන් බලා ටෙන්ඩර් පත්‍ර යැවුවොත් මැනවි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවා වූද වැඩෙහි මුළු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවී තුන් මසක් ඇතුළත කොන්ත්‍රාත්කරුවාගෙන් යම්කිසි මුදලක් අයකර ගැනීමට නොතිබුණොත් පමණකි. පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක විය යුතුවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කළ යුතුද වේ.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් බාර ගැනීම නැවැත්වූ දින සිට සති හයක් යන තුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමටද ටෙන්ඩර පත්‍රයක යම්කිසි කොටසක් පිළි ගැනීමටද බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩට ලාංකික කම්කරුවන් ගැනීමට පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. “ ලාංකිකයා ” යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක්ය යන්නයි.

14. තමාගේ යම්කිසි සේවකයෙකුගේ හෝ සේවකයෙකු වෙනුවෙන් 1934ඒ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. මෙම ගොඩනැගිලි සෑදීමට තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් හැකිතාක් දුරට එම වැඩය කරගෙන යෑමට වුවමනා කරන නුපුහුණු හා පුහුණු කම්කරුවන් එම ප්‍රදේශයෙන්ම බඳවා ගැනීමට පොරොන්දු විය යුතු අතර එම පැහැර හැරියේ නම් ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුල් කරන අතර ඔහුගේ වැඩ තහනම් කරනු ලැබේ. තවද, යම්කිසි අවස්ථාවක වැළැක්විය නොහැකි කරුණු කරණකොටගෙන මෙයින් වැළකීමට බලය කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තුමාගෙන් ලබාගත යුතුයි. මෙය කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ මාර්ග යෙන් ලබාගත යුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශ යෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදවීම කොන්ත්‍රාත්තුව පැහැර හැරියා වනවා ඇත. තවද, කොන්ත්‍රාත්කරුවා විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විසින් බලය දෙන ලද නිලධාරියකුට ඔහුගේ පොත්, චැක්රෝල් යනාදිය බැලීමට ඉඩ දිය යුතුයි.

16. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නහොත් නැතහොත් ඔහුගේ ලිපිනයට තැපෑලෙන් යැවුව හොත් නැතහොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙන ගොස් දුන්නොත් ඔහුට භාර දුන්නා කොට සැලකිය යුතුයි.

17. කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විසින් සේවයට නුසුදුසු යයි නිගමනය කරන ලද කම්කරුවන් කොන්ත්‍රාත්කරුවා විසින් සේවයට නොගත යුතුයි.

18. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ඇපකරුවන් දෙදෙනකු සොයාගෙන ඔහුගේ වියදමින්ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විසින් අනුමත කළ යුතුයි.

19. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නමක් සමග නම ඇතුළත් වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධ වන හෝ කිසි වෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

20. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නො කිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන වෙත තබාගනු ලැබේ.

21. මේ පිළිබඳ වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නොරුවේ ඉංජිනේරු වැඩපලේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගත යුතුයි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂතැන.

1959 අප්‍රේල් මස 30 වැනි දින,
පේරාදෙණියේදීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් පහත සඳහන් කර ඇති දේ සැපයීම සඳහා වෂී 1959 ජූනි මස 2 වැනි අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ:—

සන අඩි 14/10 කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ යන්ත්‍ර 25යි
වේ බැචර්ස් 15යි.

ටෙන්ඩර් ලියකියවිලි කොළඹ කොටුවේ පිහිටි වාරිමාර්ග අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් කිරීමට බලා පොරොත්තු වන අය කොළඹින් පිට කච්චේරියක හෝ කොළඹ කොටුවේ පිහිටි වාරිමාර්ග අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ රු. 250ක ඇප මුදලක් තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක. මේ ඇප මුදල ටෙන්ඩර් රෙගුලාසි අනුව නැවත ගෙවනු ලැබේ.

ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ ඉහත සඳහන් පරිදි ලබා ගත් ටෙන්ඩර් ෆෝර්ම වලය. ටෙන්ඩර් ලියකියවිලි 1959 මැයි මස 29 වෙනි සිකුරාදා දක්වා දෙනු ලැබේ.

ඊ. බී. ඊ. සෙනවිරත්න,
වාරිමාර්ග අධ්‍යක්ෂ තුමා වෙනුවට.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 500, කොළඹ,
5.5.59.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පදවිය ව්‍යාපාරයේ ඇතුන්ගෙ කන්දේ සංචාරක බංගලාවක් සෑදීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 50,000කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් වර්ෂ 1959යේ මැයි මස 27 වෙනි බදාදා පෙරවරු 11 දක්වා අනුරාධපුරයේ උතුරු මැද කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ටර් පත්‍ර හා වැඩි විස්තර පදවියේ වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන් ලාංකිකයන්, ලාංකික සමාගම් හා ආයතන විය යුතුයි. කාර්යාල වේලාවේදී 1959 මැයි 11 වෙනි සඳුදා පටන් 1959 මැයි මස 25 වෙනි සඳුදා පස්වරු 3.00 දක්වා ටැන්ඩර්පත්‍ර ලබාගත හැක.

සී. සී. ටී. ප්‍රනාන්දු,
පදවිය ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරුතැන.

වාරිමාර්ග කාර්යාලය,
පදවිය හංදිය,
29 අප්‍රේල්, 1959.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මධ්‍යම කොට්ඨාශය භාර අනුරාධපුරයේ වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් අනුරාධපුර නව නගරයේ වාරිකා නිවාසයක් ගොඩනැගීම සඳහා 1959 ජූනි මස 3 වැනි බදාදා 9.30 වන තෙක් ටැන්ඩර් බාරගනු ලැබේ.

2. මෙම ටැන්ඩර් සඳහා දෙපාර්තමේන්තුවේ රුපියල් 50,000කට හෝ වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් සුදුස්සන් වෙත්.

3. සෑම ටැන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා පෝර්ම කොල සහ සියලු විස්තර මහකනදරාව වාරිමාර්ග ඉන්ජිනේරු තැන ගෙන් ලබා ගත හැකිය. 1959 මැයි මස 8 වෙනි සිකුරාදා සිට මැයි මස 23 වෙනි සෙනසුරාදා දක්වා පෝර්ම කොල දෙනු ලැබේ.

4. ටැන්ඩර් පෝර්ම දෙනු ලබන්නේ කච්චේරියක හෝ මහකනදරාව වාරිමාර්ග කායඝාලයෙහි රුපියල් 25 ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කරන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ බවට සහතික පෙන්විය හැකි කොන්ත්‍රාත්කරුවන්ට පමණි.

5. දැනට රජයේ කොන්ත්‍රාත් කරන ටැන්ඩර්කරුවන් ඒ වැඩ භාර නිලධාරීන් ගෙන් සතුටු දායක ලෙස වැඩ සිදුවෙන බවට සහතික ඉදිරිපත් කළ යුතුය.

6. ටැන්ඩර් භාර ගැනීම අවසන් කරන දින පෙරවරු 10.30 ට අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තුමා විසින් ටැන්ඩර් විවෘත කරනු බැලීමට ටැන්ඩර්කරුවන්ට පැමිණිය හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වාරිමාර්ග ඉන්ජිනේරු තැන,
මහකනදරාව.

1959 මැයි මස 2 වැනි දින,
මිහින්තලය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මධ්‍යම පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1959 මැයි මස 20 වන බදාදා පෙරවරු 9.30 වන තෙක් නුවර වැව වැව් කණ්ඩිය ඉහත්තාවේ සක්ක ගල් බැම්මක් බැඳීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 50,000කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටැන්ඩර් බාරගනු ලැබේ.

1959 මැයි මස 19 වනදා පස්වරු 4.30 වනතුරු ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. වැඩි විස්තර සඳහා අනුරාධපුර උප කොට්ඨාශය භාර ඉංජිනේරු තුමාගෙන් විමසන්න.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊසාන දිසාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් හිඟුරක්ගොඩ අඩි 120ක් දිග සහ අඩි 40ක් පළල කර්මාන්ත ශාලාවක් බැඳීම සඳහා 1959ක්වූ මැයි මස 20 වැනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. හිඟුරක්ගොඩ වාරිමාර්ග කායඝාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 14,000කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචිවී ඇති රුපියල් 25ක් කච්චේරියේ හෝ මෙම කායඝාලයේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවනට 1959 මැයි මස 12 වැනි දින සිට 16 වැනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ.

4. දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත්කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතික පත්‍ර ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටීමට කැමැති කොන්ත්‍රාත්කරුවන් 1959ක්වූ මැයි මස 20 වැනි දින පෙරවරු 9.30ට ඊශාන දිසාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ කායඝාලයට පැමිණිය යුතුයි.

ඒ. ඇස්. ද සිල්වා,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
කවුඩුල්ල උප කොට්ඨාශය.

හිඟුරක්ගොඩ, 28.4.59.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1959 මැයි 20 වැනි බදාදා පූ. භා. 10 තෙක්, මොණරාගල උප කොට්ඨාශයට අයත් හඳපානාගල ව්‍යාපාරයේ තාවකාලික නිවාස සහ ගබඩා සෑදීම සඳහා ටෙන්ඩර පත්‍ර බාරගනු ලැබේ.

මේ සඳහා අවශ්‍ය සෑම විස්තරයක්ම මොණරාගල වාරිමාර්ග නිලධාරිතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර පත්‍ර ලබාගැනීමට හැකිවනුයේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 10,000 හෝ ඊට වැඩි මුදල් ගණන්වලට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට පමණකි. මේ සඳහා රු. 25ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන අවසාන දිනය 1959. 5. 19 දය.

වාරිමාර්ග නිලධාරිතැන.
මොණරාගල-උපකොට්ඨාශය.

28. 4. 59.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### අංක. 22 ශ්‍රී 471 දරණ ලොරියේ කැබ් එක අලුත්වැඩියා කිරීම

(මොරිස් කොමාර්ෂල් වර්ගයේ) අංක. 22 ශ්‍රී 471 දරණ ලොරියේ කැඩී බිඳී ගිය කැබ් එක සහ ඉදිරිපස අලුත් වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තුමා විසින් 1959 මැයි මස 29 වැනි දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ. මේ සඳහා නියමිත පෝර්ම නිකුත් කරණු නො ලැබේ. එහි වැඩ සඳහා විශෙෂ විස්තරයක් පහත දැක්වේ.

**විශෙෂ විස්තරය :**—අවශ්‍ය උපකරණ හා කම්කරුවන් පහත සඳහන් වැඩ සඳහා තමන් විසින්ම සැපයීම. නැමීගිය කොටස් ප්‍රකෘතිමත් කිරීම. නැවත හැඩය ගැණීම. හානි වූ කොටස් කපා හැරීම, සහ නැවත සෑදීම, ඇතුළුව වැල්ඩින් කිරීම, වින්ඩ්ස්ක්‍රීම් එක හා පැති වීදුරු සැපයීම හා සවිකිරීම, වක් වූ යාන්ත්‍රික උපකරණ අලුත්වැඩියා කිරීම, සහ කැඩී බිඳී ගිය කැබ් එක පළමු අයුරින්ම සම්පූර්ණ කිරීම. පින්තාරු කිරීම මීට ඇතුළත් නොවේ. එහෙත් සියලු ලෝහ වැඩ මූලික පින්තාරුව සඳහා මට්ටම් කළ යුතුයි. වැඩ පළේ භූමියේ කොටසක අලුත්වැඩියා කිරීම කළ යුතුයි. මේ වැඩය සඳහා තම තමන්ගේ බඩු බාහිරාදිය ගෙන ඊමට හෝ කම්කරුවන් යෙදවීමට වැඩපලේ වැඩ කරණ කාලය තුළදී අවකාශ ඇත. ඔවුන්ගේ පරිපාලනය හා විධානය ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (ප්‍රවාහන) යටතේය. බඩු බාහිරාදිය ගබඩා කිරීම ඔහුගේ අනුදැනීම ඇතිව කළ යුතුයි.

2. සියලු ටෙන්ඩර් සීල් තබා සෑම කවරයකම "අංක. 22 ශ්‍රී 471 දරණ ලොරිය අලුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩරය" යනු ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි සටහන් කර අධ්‍යක්ෂක, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය ලියුම් කවරයෙහි පහත වම් කෙළවරෙහි සඳහන් කළ යුතුයි. ටෙන්ඩරය ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ටෙන්ඩර් කරු විසින්ම හෝ එසේ නැතිනම් ඔහුගේ ඒජන්ත විසින්ම, කොළඹ, ගාළු මුවදොර මහාලේකම් ගොඩනැගිල්ලේ අංක. 320 දරණ කාමරයෙහි සිටින ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තුමා වෙත පුද්ගලිකව භාරදිය හැක. එය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර 1959 මැයි මස 29 දින පෙරවරු 10 ට මහාලේකම් කායීාලයේ අඩක 320 දරණ කාමරයෙහිදී විවෘත කරණු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට කැමති නම් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටිය හැක.

4. සාර්ථක වූ ටෙන්ඩර් කරු විසින් ටෙන්ඩරය පිළිගත් බැව් ඔහුට දැන්වූ දින සිට සති දෙකක් ඇතුළදී අලුත්වැඩියා කිරීම සම්පූර්ණ කළ යුතුයි. කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ටෙන්ඩර් කළ මුළු මුදලෙන් සියයට 5 කට වැඩි නොවූ මුදලක් ඇපයක් වශයෙන් තැබිය යුතුයි. යමෙක් එසේ තැන්පත් කිරීමට අසමත් වුවහොත් හෝ එකී වැඩය පැහැර හැරියහොත් ඔහු නුසුදුසු කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයට ඇතුළත් කර නැවත රජයේ කොන්ත්‍රාත්තුවකට ඉදිරිපත් වීමට නොහැකි ලෙස ක්‍රියා කරණු ලැබේ. ඇප මුදල ආපසු ගෙවනු ලබන්නේ එම වැඩය සතුටුදායක ලෙස සම්පූර්ණ කළහොත් පමණකි.

5. කිරිලපොනේ දෙපාර්තමේන්තුවේ වැඩ පොලේදී ලොරිය පරීක්‍ෂා කළ හැක.

6. ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් මුළුමනින්ම හෝ කොටස් වශයෙන් භාර ගැණීමේ හෝ ප්‍රතික්‍ෂෙප කිරීමේ බලය දෙපාර්තමේන්තුව සතුය.

ජී. ගුණතිලක,
ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ වෙනුවට,

1959 අප්‍රේල් මස 30 වෙනි දින,
කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### වහල සෙවිලි කිරීමට ඇස්බැස්ටෝස් පිලි සැපයීම

පහත සඳහන් ඇස්බැස්ටෝස් පිලි සඳහා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1959 ජූනි මස 2 වැනි අඟහරුවාදා පෙරවරු 10 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. වහල ගැසීම සඳහා වූ ඇස්බැස්ටෝස් පිලි තහඩු බ්‍රිතාන්‍ය විශෙෂ විස්තරයට සරිලන ඳැ විය යුතුයි. දිගින් අඩි 6, 7 හෝ 8ක් සහ පළලින් අඩි 3 අඟල් 6 හෝ අඩි 3 අඟල් 8ක පරිමාණය ඇති ඒවා විය යුතුයි.

පිලි කිරීම පහත දැක්වෙන අයුරින් එකක් විය යුතුයි :—

(අ) බිග්සික්ස් වර්ගය—ඇණපොට දෙකක් අතර දුර අඟල් 6ක් පමණ.

(ආ) කුඩා පිලි—ඇණපොට දෙකක් අතර දුර අඟල් 3ක් පමණ. හෝ

(ඇ) අර්ධ පිලි වර්ගය—

උවමනා කරන ප්‍රමාණය :—6′-0″ × 3′-6″ = තහඩු 2,000.
7′-0″ × 3′-6″ = තහඩු 2,000.
8′-0″ × 3′-6″ = තහඩු 1,000.

3. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල වශයෙන් රු. 100ක් ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂක තුමාගේ කායීාලයට හෝ කොළඹින් බැහැර කච්චේරියකට බැඳ ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කර. කොළඹ ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂක තුමාගෙන් 1959 මැයි මස 29 වැනි සිකුරාදාට ප්‍රථම ලබා ගත හැකි අයදුම් පත්‍රයක් සමග අනු පිටපතක් ද පූරවා ඉහත කී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට ඉදිරිපත් කළ යුතුයි.

4. කොළඹ, ගාලු මුවදොර මහලේකම් කායීාල ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයේදී 1959 ජූනි 2 වැනි අඟහරුවාදා පස්වරු 2.30ට මෙම ටෙන්ඩර් විවෘත කරණු ලැබේ. කැමැති නම් ටෙන්ඩර් කරුවන්ට එකී අවස්ථාවේදී පැමිණ සිටිය හැකිය.

5. වැඩි දුරටත් අවශ්‍ය කරුණු ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂකතුමාගෙන් ලබාගත හැකිය.

ජී. ගුණතිලක,
ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂක වෙනුවටය.

1959 අප්‍රේල් මස 30 වෙනි දින,
කොළඹ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාතීමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන ට්‍රිපොලි වෙළඳ සැළට 1959. 6. 1. සිට 1959. 6. 30 දක්වා ඇති කාලය තුලදී අළුත් බිත්තර සැපයීම පිණිස ටෙන්ඩර් 1959 මැයි මස 18 වැනි සඳුදා අපර භාග 2.30 වන තෙක් කොළඹ යූනියන් ප්ලේස්හි පිහිටි ගොවිකම් සහ ආහාර ඇමති කායීංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීපියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාතීමේන්තුවෙන් 1959. 5. 18 වැනි දින දවල් 12 වනතුරු ලබාගතහැකි ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පෝරමවල ටෙන්ඩර් ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීපියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාතීමේන්තුවෙන් දැනගත හැක.

ඩබ්ලිව්. ඩී. ඕ. තිලකරත්න,
අලෙවිකිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1959. 5. 4 වැනි දින
කොළඹ—1, චැතැම් වීපියේ අංක 62 දරන
ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ
දෙපාතීමේන්තුවේදී යැ.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාතීමේන්තුවට අයත් කොළඹ බොරැල්ලේ පිහිටි මුළුතැන්ගෙට සුදු තෙල්කරඳසි සහ විදේශීය පරණ පත්‍ර සැපයීම පිණිස ටෙන්ඩර් 1959 යේ මැයි මස 25 වැනි සඳුදා අපර භාග 2.30 වන තෙක් කොළඹ යූනියන් ප්ලේස්හි පිහිටි ගොවිකම් සහ ආහාර ඇමති කායීංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීපියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාතීමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රුපියල් 100 ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කර, 1959යේ මැයි මස 25 වැනි සඳුදා දවල් 12 වනතුරු ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පෝරම, කොළඹ කොටුවේ චැතැම් වීපියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාතීමේන්තුවෙන් ලබාගෙන ටෙන්ඩර් ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර ඉහත සඳහන් අලෙවිකිරීමේ දෙපාතීමේන්තුවෙන් දැනගත හැක.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවිකිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1959 මැයි මස 4 වැනි දින,
කොළඹ—1, අලෙවිකිරීමේ
දෙපාතීමේන්තුවේදී යැ.

---

## අලෙවි කිරීම් සංවර්ධන දෙපාර්තමේන්තුව

අලෙවි කිරීම් සංවර්ධන දෙපාර්තමේන්තුවට උවමනා පහත සඳහන් දිග පළලැති දුඹුරුපාට කඩදාසි මළු බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයට සපයා ගෙනත් දීම පිණිස ටෙන්ඩර ඉල්ලුම් පත්, කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේදී අලෙවි කිරීම් සංවර්ධන කොමසාරිස්වරයා විසින් 1959 මැයි 26 වැනි අඟහරුවාද සවස 2.30 දක්වා බාරගනු ලැබේ :—

අඟල් 9″ × 12″ දිග පළලැති ග්‍රැෆ්ට් පේපර් වලින් සාදන ලද දුඹුරුපාට කඩදාසි මළු 200,000ක් ද,

අඟල් 10″ × 13″ දිග පළලැති ග්‍රැෆ්ට් පේපර් වලින් සාදන ලද දුඹුරුපාට කඩදාසි මළු 100,000ක් ද

සපයා ගෙනවුත් බාරදිය යුතුයි.

ඒ සඳහා උවමනා ටෙන්ඩර පෝර්ම සහ වැඩි විස්තර, කොළඹ කොටුවේ චැතැම් විදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවි කිරීම් සංවර්ධන කොමසාරිස් කායීාලයෙන් 1956. 5. 26 වැනි අඟහරුවාදා දවල් 12ට කලින් ටෙන්ඩර පෝර්ම අනුපිටපතක්ද සහිතව ලබාගත යුතුය.

ඇල්. බී. රාජකරුණා,
අලෙවි කිරීම් සංවර්ධන කොමසාරිස් වෙනුවට.

1959 මැයි 2 වැනි දින,
කොළඹ, අලෙවි කිරීම් සංවර්ධක
කොමසාරිස් කායීාලයේදීය,

3. ටැන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂතැනගේ (එස්. ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරණු ලබන්නේ 2 වැනි ඡේදයේ සඳහන්වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණකි.

4. පූර්වෝක්ත 2 වෙනි ඡේදයේ සඳහන්වන පරිදි අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝරම එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරිතැනගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මලය වීදිය, කොළඹ 2" යන ලිපිනයට රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාරී නිලධාරිතැනට භාරදී, එසේ භාරගත් බවට එකෙණෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුයි.

5 1959 මැයි මස 29 වන කිවිදින පස්වරු 2.30 ට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනවිට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරණු ලබන නිලධාරිතැන විසින් ගාස්තු ප්‍රමාණයද (රේට් ගණන්ද) ටෙන්ඩර් කරුවන්ගේ නම් ද පැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුල සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටැන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් අවසර දී ඇති විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකණු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරණු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඇම්. බී. නූර්දීන්,
දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරිතැන.

1959 මැයි මස 4 වැනි දින,
ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන ඇමති කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1959 මැයි මස 29 වැනි සිකුරාද පෙරවරු 10.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසලේ නම | කළයුතු වැඩය |
|---|---|
| කු/ඇලබඩගම සි. මි. පා. ... | පාසල් ගොඩනැගිලි, ගුරුනිවාස හා වැසිකිළි |

සංලක්ෂ්‍යය.—කු=කුරුණෑගල දිස්ත්‍රික්කය.

2. රු. 60,000කට හෝ ඊට වැඩි ගණනකට ගොඩනැගිලි තැනීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචිව සිටින අයට, අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාව) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රු. 100 ඇප මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කරන්නාවූ අයට 1959 මැයි මස 28 වන දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. චැක්පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කුරුණෑගල, වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරිතුමාගෙන් හෝ කොළඹ 2, අධ්‍යාපන අධ්‍යක්ෂකතැනගේ කාර්යාලයෙන් (එස්. ඩබ්ලිව්. ශාඛාව) ලබාගත යුතුය. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරණු ලබන්නේ 2 වන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. පූර්වෝක්ත 2 වන ඡේදයේ සඳහන් වන පරිදි කුරුණෑගල, වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු කුරුණෑගල, වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් දැනගත හැකියි. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, අධ්‍යාපන ඇමති කාර්යාලය, මලයි වීදිය, කොළඹ 2" යන ලිපිනයට රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නො එවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන ඇමති කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

5. 1959 මැයි මස 29 වන සිකුරාද පෙරවරු 10.30ට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන ඇමති කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එවිට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින්, ටෙන්ඩර්කරුවන්ගේ නම්ද, ප්‍රමාණයන්ද (රේට් ගණන) පැමිණි අයට ඇසෙන්ට කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසාන කර සති 6කට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර කුරුණෑගල, වයඹ පළාතේ අධ්‍යාපන කාර්යාලයෙන් දැනගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැකිය.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ, සේවයේ යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂකවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළා සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඇම්. ඊ. ධම්දාස,
වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්යාලය,
කුරුණෑගල, 4 මැයි 1959.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කොළඹ 2 මලයි වීදියේ අධ්‍යාපන දෙපාතීමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1959 මැයි මස 29 දින පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසලේ නම | වැඩ විස්තරය |
|---|---|
| අ/මැදවච්චිය මහා විද්‍යාලය. | විද්‍යාගාරය. |

සංලක්ෂය.—අ=අනුරාධපුර දිස්ත්‍රික්කය.

2. රුපියල් 25,000 හෝ වැඩි ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 50,000 හෝ වැඩි ගණනකට ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචිවී සිටින අයට කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකින් වැඩය සඳහා රු. 100ක් තැන්පත් කළ කුවිතාන්සියක් අනුරාධපුර අධ්‍යාපන නිලධාරීනීට ඉදිරිපත් කිරීමෙන් 28.5.59 වෙනි දින පස්වැ 3.30 දක්වා ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකිවේ. මනිඕඩර්, පෝස්ටල් ඕඩර්, චෙක්පත්, භාරගනු නො ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ, අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කායසීලයේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර අධ්‍යාපන නිළධාරීනිගෙන් හෝ ලබාගත හැකි මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවන ඡේදයේ සඳහන් පරිදි ලියා පදිංචිවී සිටින බව ඔප්පු කළ හැකි අයට පමණි.

4. ඉහත සඳහන් පරිදි පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා අනුරාධපුර අධ්‍යාපන නිළධාරිනීගෙන් ලබාගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල් හා සියලුම වැඩි විස්තරද අනුරාධපුර අධ්‍යාපන නිළ ධාරිනීගෙන් ලබාගත හැක. කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනට ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුයි. දේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට අකැමති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් සීල් තබන ලද ටෙන්ඩර් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කායසීල සහකාර තැනට භාරදී, එසේ භාරගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබාගත යුතුයි. මුද්‍රාව තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ඇතුළත් කවරය මත ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයත් වැඩයෙහි විස්තරත් සඳහන් කළ යුතුයි.

5. කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 29.5.59 දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන නිළධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුළ විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර උතුරු මැද පළාතේ අධ්‍යාපන කායසීල යෙන් දැන ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැකියි.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකි තාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදවීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇති අධ්‍යාපනාධ්‍යක්ෂකවරයා විසින් අවසර දී ඇති විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නො පිළිපැදීම කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඉව්ලින් ප්‍රනාන්දු,
උතුරු මැද පළාතේ අධ්‍යාපන නිළධාරිනී.

අධ්‍යාපන කායසීලය,
1959 අප්‍රේල් 23 දින,
අනුරාධපුරය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශ යෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1959 ජූනි මස 2 වැනි කුජදා උදේ 10 වනතෙක් භාරගනු ලබේ :—

(1) අනුරාධපුර නව රෝහලට ජල සම්පාදන ක්‍රමයක් තැනීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරුතුමා විසින් 1959 මැයි 20 වැනිදා සවස 4 වන තෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 1,00,000 වඩා වටිනාකමැ'ති ජල සම්පාදන කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රුපියල් 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම්කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරා ගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් සියයට 5 වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳී මක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත් කොළඹ, ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩ නැගිල්ලේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කායසීලයේ අංක 155 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් තුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී හැම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

ඊ. බී. ඇන්කිවේල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1,434,
කොළඹ 7,
30.4.59.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර පමණක් සැපයීම

වර්ෂ 1959 සැප්තැම්බර මස 30 වැනිදායින් අවසාන වන වර්ෂය තුළ, මේ සමග ඇති උප ලේඛනයේ පළමු තීරයෙන් දක්වා ඇති ආයතනයට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ ගාලු මුවදොර මහලේකම් කාර්යාලය යාබද "බී" අක්ෂරය දරන ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන විසින් භාරගනු ලැබේ.

2. මේ සමග ඇති උප ලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර පත්‍ර පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වුවහොත් මගේ හෝ මවිසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියකුගේ අනුමතිය ඇතිව ඒවායේ පිටපතක් පරීක්ෂා කළ හැකි ය.

3. මේ කාර්යාලයෙන් හෝ කොළඹ, කළුතර, ගාල්ල, මාතර, කෑගල්ල, මහනුවර, මාතලේ, බදුල්ල, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය, වවුනියාව, යාපනය, රත්නපුරය සහ පුත්තලම යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් ලබා ගන්නා ලද නියමිත පෝර්මයේ නොවන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. මේ සමග ඇති උප ලේඛනයේ දෙවෙනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් මගේ නාමට, කොළඹ කච්චේරිය හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ කොටුවේ බ්‍රිස්ටල් වීදියේ ලංකා බැංකුවේ තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට කලින් ලබාගත යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක්කේ මෙම කුවිතාන්සිය ඉදිරිපත් කළහොත් පමණි. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය පෝර්ම මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. නියමිත පෝර්මයෙහි නොවන තැන්පත් මුදල් බැංකුව මගින් භාරගනු නො ලැබේ. අයදුම්කරුවන් විසින් ලබාගත් එම කුවිතාන්සි ටෙන්ඩර් පත් නිකුත් කෙරෙන අවසාන දින දවල් 12ට පෙර මෙම කාර්යාලයට හෝ අනිකුත් සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකි ය.

5. සෑම ටෙන්ඩරයක් ම කොළඹ ගාලු මුවදොර මහලේකම් කාර්යාලය යාබද "බී" අක්ෂරය දරන ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ තැ. පෙ. 584, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නාමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද සඳහන් කළ යුතුයි. ටෙන්ඩර පත් මෙම කාර්යාල යෙහි පිහිටුවා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ කොන්ත්‍රාත් සැපයීම පිළිබඳ ගණකාධිකාරිවරයාට පුද්ගලිකව භාර දී එය ලැබුණු

බවට කුවිතාන්සියක් ද ලබාගත හැක. ටෙන්ඩර්කරුවන්ට සිය ටෙන්ඩර් පත් ලියාපදිංචි කළ තැපෑලෙන් ද එවීමට පුළුවන. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දින පෙරවරු 10ට පසු තැපෑලෙන් එවන හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක් ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නො දරන අය ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම් සම්බන්ධ තොරතුරු මා වෙත හෝ ඒවා ලබා ගැනීමට බලාපොරොත්තු වන සෞඛ්‍ය සේවා අධිකාරිවරයාට දන්වා සිටිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය පෝර්ම මගෙන් හෝ මෙහි තෙවැනි ඡේදයෙහි සඳහන්ව ඇති සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් ද ලබාගත හැක. දැනට දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්තු දරන අයදුම්කරුවන් ඒ බැව් සඳහන් කළ යුතුයි. දැනට මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්තු නො දරන අය තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු සපයා තිබේ ද, එසේ නම් කවරකු වෙත ද යනුවෙන් සඳහන් කළ යුතුයි.

සැ. යු.—ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැන ගැනීමට ප්‍රථම ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් භාර ගැනීමට නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව සපයා එවිය යුතුයි.

7. එක් එක් ආයතනයක් සඳහා සැපයිය යුතු ආහාර ප්‍රමාණය දළ වශයෙන් තෙවැනි ඡේදයෙහි සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරීවරයින් ගෙන් හා මෙම කාර්යාලයෙන් ද ලබාගත හැක.

8. ටෙන්ඩර්කරුවා තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ඔහු විසින් ටෙන්ඩර් පෝර්මයේ "බී" උප ලේඛනයට අයත් "ආහාර" සැපයීම සඳහා අයකිරීමට බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සේවාව සඳහා වියදම් වන මුළු මුදල අනුව ය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි "සී" උප ලේඛනයට අයත් විශේෂ ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් ද සඳහන් කළ යුතුය. එහෙත් ගෙවීම කරනු ලබන්නේ ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිල හෝ සාමාන්‍ය වශයෙන් එදිනෙදා වෙළඳ පොළේ පවතින මිල යන දෙකින් අඩු වටිනාකම ය.

ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් විසින් සඳහන් කරනු ලබන මිල ගණන් මෙහි පළමුවන ඡේදයෙහි දක්වා ඇති කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු කොන්ත්‍රාත් කරුගේ අත්සන ලබාගන්නා පොරොන්දු පත්‍රයෙහි සඳහන් නො වන කිසිම හේතුවක් උඩ එම මිල ගණන් වෙනස් නොකළ හැකි වන්නේ ය.

9. තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

10. ටෙන්ඩරය පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතු ද වන්නේ ය.

පී. රත්නසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශය,
තැ. පෙ. 584,
දිනය : 5.5.59.

| | 2 | 3 | 4 |
|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සහ වේලාව |
| මාවතගම ආරෝග්‍ය ශාලාව | 100 | 800 | 28. 5. 59 පෙ: ව: 10.00 |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
### සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1959 ජූනි මස 9 වැනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

(1) මැදවෙල රෝහලට ජල සම්පාදන ක්‍රමයක් තැනීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1959 මැයි 29 වැනි සිකුරාදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 10,000 වඩා වටිනාකමැති ජල කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ ලංකා බැංකුවේත් කොළඹින් පිටත නම් කච්චේරියකින් රු 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්‍ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් සියයට 5 කට වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත් කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපැලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපැලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේ දී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිළධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම් කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

ඊ. බී. ඇන්කිටේල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.
5.5.59.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කළුතර, කටුකුරුන්දේ 1 ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 16ක් සහ ළිං 2 ක් තැනීම

කළුතර, කටුකුරුන්ද නමැති ගමෙහි 1 ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 16ක් සහ ළිං 2ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 ජූනි මස 5 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 64,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 65ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 ජූනි මස 3 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1959 අප්‍රේල් මස 28 වැනි දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 1.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### පානදුර, වාද්දුව බටහිර 1 ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 20ක් සහ ළිං 2ක් තැනීම

පානදුර, තොටමුන, වාද්දුව (බටහිර) 1 ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 20ක් සහ ළිං 2ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 මැයි මස 29 වෙනි සිකුරාද පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තර ද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 75,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 75 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 මැයි මස 27 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා
ජාතික නිවාස කොමසාරිස් තැන.

1959 මැයි 4,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 1.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### ගොංගිතොට තාප්ප බිත්ති ගෙවල් 81ක් කඩා නැවත ගඩොලින් තැනීම

ගොංගිතොට තාප්ප බිත්ති ගෙවල් 81ක් කඩා නැවත හුණු සහ ගඩොලින් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 මැයි මස 29 වෙනි සිකුරාද පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 1,50,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 150ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 මැයි මස 27 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1959 මැයි 4,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 1.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### දඹුල්ලෙහි 1 ඔබ්ලිව් වර්ගයේ ගෙවල් 20 සහ ලිං 1ක් තැනීම

දඹුල්ලෙහි 1 ඔබ්ලිව් වර්ගයේ ගෙවල් 20 සහ ලිං 1ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 මැයි මස 29 වෙනි සිකුරාද පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තර ද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 75,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 75 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 මැයි මස 28 වෙනි බ්‍රහස්පතින් ද දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1959 මැයි 4,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 1.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කෑගල්ල දිස්ත්‍රික්කයේ කබගමුවේ, 1 ඔබ්ලිව් වර්ගයේ ගෙවල් 6ක් සහ ළිඳක් තැනීම

කෑගල්ල දිස්ත්‍රික්කයේ කබගමුවේ පිහිටි යටදිරිය වත්තේ, 1 ඔබ්ලිව් වර්ගයේ ගෙවල් 6ක් සහ ළිඳක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 මැයි මස 29 වෙනි සිකුරාද පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 30,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 50ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 මැයි මස 27 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1959 මැයි 4,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 1.

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### ලක්ෂපාන බලවිදුලි මධ්‍යස්ථානයේ පිහිටි එක නළ මගක ඇතුල් පැත්ත පින්තාරු කිරීම

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1959ක් වූ ජූනි මස 3 වන බදාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වර්ෂ 1959ක් වූ මැයි මස 23 වන දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1959ක් වූ ජූනි මස 3 වන දින පූ. භා. 10 ට රජයේ විදුලි දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

1959ක් වූ මැයි 8 වන දින,
තැ. පෙ. 540, කොළඹ.

---

## ලුණු දෙපාර්තමේන්තුව

### පොල් අතු සැපයීම

තිලාවෙලි සහ මන්නාරම ලුණු ලේවාවලට පොල් අතු (ඉරු දෙකේ) 30,000ක් පමණ සැපයීම සහ ගෙනත් භාරදීම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ කොම්පඤ්ඤවීදියේ ජෙනරල්ස් ලේක් පාරේ නො. 110, තැ. පෙ. නො. 539 දරණ ලුණු කොමසාරිස් තැන විසින් 1959 මැයි මස 29 වැනි දින සිකුරාදා පස්වරු 3 වනතුරු භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනුපිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කායභීලයෙන් හෝ එම කී ලුණු ලේවා කොට්ඨාශවලට අයත් ආන්ඩුවේ දිසාපතිවරුන්ගෙන් හෝ එම කී ලුණු ලේවා භාරකාර නිලධාරීන්ගෙන් ලබාගන්නා පෝර්ම කොළවලය. ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 25ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කායභීලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටැන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස් තැන.

අංකය : ටී. ජී. 205,
1959 මැයි මස 8 වැනි දින,
කොළඹ.

---

## ලුණු දෙපාර්තමේන්තුව

### පොල් අතු සැපයීම

ඇලිපන්ට් පාස් ලුණු ලේවායට පොල් අතු (ඉරු දෙකේ) 2,50,000ක් පමණ සැපයීම සහ ගෙනත් භාරදීම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ නව මහා ලේකම් ගොඩනැගිල්ලේ තැ : පෙ : නො : 570 දරණ කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1959 ජූනි මස 3 වැනි බදාදා දවල් 12 වනතුරු භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ යාපනේ ආණ්ඩුවේ දිසාපතිතැන ගෙන් හෝ ඇලිපන්ට්පාස් ලුණු අධිකාරි තැනගෙන් ලබාගන්නා පෝර්ම කොළවලය. ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු : 50ක් ඕනෑම කච්චේරියක බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටැන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස් තැන.

අංක : ටී. ජී. 8,
1959 මැයි මස 8 වැනි දින,
කොළඹ.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

1959 ඔක්තෝබර් 1 වැනි දින සිට අවුරුද්දක කාලයතුල පහත දැක්වෙන දුම්රිය ස්ථානයන්හි බඩු පැටවීමේ සහ බෑමේ සේවය සඳහා රජයේ ලියා පදිංචිවූ ගැනුම් යෝජනා (ටැන්ඩර්) කරුවන්ගෙන් ගැනුම් යෝජනා පත්‍ර කොළඹ, තැ. පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරී තැනගේ කායභීලයීය ගැනුම් යෝජනා මණ්ඩලයේ සභාපති තැන විසින් 1959 ජූනි මස 3 වැනි බදාදා පෙරවරු 9.30 වනතෙක් භාරගනු ලැබේ.

1. මාතර 2. ගාල්ල 3. පොල්ගහවෙල 4. කුරුණෑගල 5. මහව 6. මඩකලපුව 7. යාපනය සහ කන්කසන්තුරේ 8. රඹුක්කන 9. පේරාදෙනිය 10. මහනුවර 11. වත්තේගම 12. මාතලේ 13. ගම්පොල 14. නාවලපිටිය 15. තලවකැලේ 16. වටගොඩ 17. නානුඔය 18. හපුතලේ 19. බන්ඩාරවෙල සහ 20. බදුල්ල

දුම්රිය වාණිජ අධිකාරිතැනගේ කායභීලයෙන් ආකෘති පත්‍රිකා ලබාගෙන, ගැණුම් යෝජනා පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. ගැනුම් යෝජනා තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 100ක් දුම්රිය ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කායභීලයයෙහි හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කායභීලයක තැන්පත්කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට, 1959 ජූනි මස 2 වැනිදා පස්වරු 3 වන තෙක් ගැනුම් යෝජනා පත්‍රිකා ලබාගත හැක.

“විශෙෂ” සහ “සාමාන්‍ය” විස්තර ප්‍රකාශනයන් සමග මෙම පත්‍රිකාවද ගැනුම් යෝජනාපත්‍ර සමග ලියුම් කවරයක බහා සීල් තබා කොළඹ, තැ. පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරි තැනගේ කායභීලයීය ගැනුම් යෝජනා මණ්ඩලයේ සභාපති තැන වෙත ලියා පදිංචිකළ තැපලෙන් එවා හෝ ගැනුම් යෝජනා කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතවරුන් විසින් දුම්රිය වාණිජ අධිකාරිතැන වෙත ගෙනවිත් භාරදිය හැක. එම ලියුම් කවරයෙහි ඉල්ලුම් කරන සේවය, නම සහ ලිපිනයද සඳහන් කළ යුතුවෙයි. දුම්රිය වාණිජ අධිකාරිතැන එය වහාම ගැනුම් යෝජනා පත්‍ර පෙට්ටියේ තැන්පත් කරන අතර ඒ වෙනුවෙන් කුවිතාන්සියක්ද නිකුත් කරණු ලැබේ. ඉහත සඳහන් කළ වේලාවට පසුව ගැනුම් යෝජනාපත්‍ර භාරගනු නොලැබේ.

ගැනුම් යෝජනා කරුවන් කැමතිනම් ගැනුම් යෝජනාපත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටිමට ඉඩදෙනු ලැබේ. ගැනුම් යෝජනාපත්‍ර භාරගැණීම නැවැත්වීමට නියමිත ඉහතකී දිනයේ ඉහතකී වේලාවේදී දුම්රිය වාණිජ අධිකාරිතැනගේ කායභීලයේදී ගැනුම් යෝජනාපත්‍ර විවෘත කරණු ලැබේ.

තමන් විසින් ඉල්ලුම් කරණු ලැබූ සේවය භාරගැණීම සඳහා ගැණුම් යෝජනා පත්‍ර භාරගැණීමේ අවසාන දින සිට සති තුනක් ගැනුම් යෝජනා කරුවන් බලාපොරොත්තුවෙන් සිටිය යුතුයි.

වැඩි විස්තර දුම්රිය වාණිජ අධිකාරිතැනගේ කායභීලයෙන් ලබාගත හැක.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරි තැන.

1959 මැයි 2 වැනිදා,
තැ: පෙ: 355, කොළඹදී.

---

## මාතර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

පහත සඳහන් වාරිමාර්ග වැඩ සඳහා 1959 ජූනි මස 1 වෙනි දින පෙරවරු 9.30 දක්වා මාතර දිසාපතිතුමා විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නවා ඇත.

### ගඟබඩ පත්තුව

(1) බතලවත්ත දෙනිය අමුණ සෑදීම—කිරින්ද.

(2) නුගගහදෙනිය වැව අළුත්වැඩියා කිරීම—කිරින්ද මගින් පහළ.

(3) ගිනිගත් අමුණ අළුත්වැඩියා කිරීම—බටුවිට.

### වැල්ලබඩ පත්තුව

(4) ගොඩවාන අමුණ අළුත්වැඩියා කිරීම—වත්තෙගම.

(5) බෝගහහේන පැනි බැම්ම සෑදීම—බඹරන්ද උතුර.

(6) පරවාහැර බිබුලේ බැම්මක් සෑදීම—පරවාහැර.

### මොරවක් කෝරළය

(7) කණුමුල්දෙනිය මහ වේල්ල රෙගුලේටරය තැනීම—පුවක්බඩ ඕවිට.

2. මේ වැඩ ගැන සියළු විස්තර කාර්යාලයීය වේලාවන්හිදී මාතර ආණ්ඩුවේ ඒජන්ත තැනගෙන් දැනගත හැක. ටෙන්ඩර් කළ යුත්තේ එතුමාගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් පත්‍රවලය. 1959ක්වූ මැයි මස 9 වෙනිදා සිට 1959 මැයි මස 30 වෙනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. මෙම වැඩ සඳහා රු. 10 බැගින් මෙම කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක තැන්පත් කිරීමෙන් ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැකිය. ලියාපදිංචි කළ විවිධ සේවා සමුපකාර සමිති හා ලියාපදිංචි කළ ග්‍රාමසංවර්ධන සමිති වලින් ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා මේ තැන්පත් මුදල අවශ්‍ය නොවේ.

3. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ මෙම කච්චේරියේ රු. 1,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක්ය. ටෙන්ඩර් පත්‍රිකා ලබාගැනීමට පැමිණෙන විට ලියාපදිංචි කිරීමේ රැකෝඩ් පොත ද රැගෙන ආ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර එවන සියළුම ලියුම් කවර වල වම් පැත්තේ ඉහළ කොනේ “සුළු වාරිමාර්ග සම්බන්ධ ටෙන්ඩර් පත්‍ර” යන්නෙන් සඳහන් කර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. නැතිනම් කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. 1959 ජූනි මස 1 වෙනි දින පෙරවරු 9.45 ට මෙම කච්චේරියේ සහකාර ඡන්ද අධිකාරි තැන විසින් ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. එම අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට ද පැමිණ සිටිය හැකිය.

5. 1.6.59 වෙනි දින සිට දවස් 45ක් ගතවන තුරු තමන් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍රය අනුව වැඩ භාරගැනීමට සූදානම්ව සිටිය යුතුයි.

පී. හත්තොටුව,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන වෙනුවට.

1959 අප්‍රේල් මස 23 වැනි දින,
මාතර කච්චේරියේදී ය.

## මාතර කච්චේරිය

### පොදු ලිං දෙකක් තැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත සඳහන් කාර්යය සඳහා 1959 මැයි මස 30 වැනි දින උදේ 10 වන තුරු මාතර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

මාතර වැල්ලබඩ පත්තුවේ දෙලවැලිකඩ මසුන් මරන්නන් සඳහා වූ නිවාස යෝජනා ක්‍රමයේ අඩි 3ක් උසට තාප්පයත්, හරස් ලීයත්, කප්පියත් ඇතිව පරිධිය අඩි 8ක් සහ වැඩිම ගැඹුර අඩි 40ක් වන සේ පොදු ලිං දෙකක් තනා නිමකිරීම සඳහා. වැඩි විස්තර පහත අත්සන් කරන්නාගෙන් ලබාගත හැකිය.

2. සියළුම ටෙන්ඩර් මාතර කච්චේරියේ හෝ දිවයිනේ වෙන ඕනෑම කච්චේරියක හෝ රුපියල් 10ක් තැන්පත් කිරීමෙන් ලබාගත යුතු කුවිතාන්සියක් ඉදිරිපත්කොට ලබාගත යුතු නියමිත ටෙන්ඩර් ෆෝර්මවල වියයුතු ය. ටෙන්ඩර් ෆෝර්ම නිකුත්කරනු ලබන්නේ 1959 මැයි මස 28 වැනි දින සවස 3 දක්වා පමණකි.

3. සියළුම ටෙන්ඩර් අත්සන් කර කවරවල බහා මුද්‍රා තබා නියමිත දින නියමිත වේලාවට හෝ ඊට ප්‍රථම ලැබෙන ලෙස ලියාපදිංචි කළ තැපෑලෙන්, "දිසාපති, කච්චේරිය, මාතර" යන ලිපින යට එවිය යුතු ය. ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් ඒ සඳහා මාතර කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ, "පොදු ලිං තැනීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතු ය.

4. ටෙන්ඩර්කරුවන් විසින් තම තමන්ගේ ලිපිනයන් පැහැදිලි අකුරින් ටෙන්ඩර් ෆෝර්මයේ සඳහන් කළ යුතු ය. එසේ සඳහන් කරනු ලබන ලිපිනයකට තැපෑලෙන් යවනු ලබන හෝ ගෙනගොස් භාරදෙන හෝ ටෙන්ඩර්කරුවෙකුගේ අතට භාරදෙන හෝ ඕනෑම නිවේදනයක් ටෙන්ඩර්කරුට යථා කාලයේ ලැබුන ලෙස සලකනු ලැබේ.

5. ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන වේලාවේදී ටෙන්ඩර් විවෘත කරනවා ඇත. එම අවසථාවේදී ටෙන්ඩර්කරුවන් කැමැති නම් බලා සිටිය හැකි ය.

6. ටෙන්ඩරයේ සඳහන් ගණන ඉලක්කමින් මෙන්ම අකුරින් ද සඳහන් කළ යුතු ය. සෑම වෙනස් කිරීමක්ම අත්සන් තැබීමෙන් සහතික කළ යුතු ය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු මාතර දිසාපති සමග ගිවිසුමකට බැඳිය යුතුවා මෙන්ම ටෙන්ඩරය පිළිගනු ලැබුවේ යම් ගණනකට ද ඒ ගණනින් සියයට 5 ක මුදලක් ඇප වශයෙන් මාතර කච්චේරියේ තැන්පත් කළ යුතු ය. මෙම මුදල ආපසු දෙනුයේ මනා අන්දමින් කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමෙන් පසුව පමණකි.

8. පොරොන්දු පත්‍රයට ඇලවීම සඳහා අවශ්‍ය මුද්දරවල ගාස්තුව තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින්ම දැරිය යුතු ය.

9. ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කරන ලද මුදල් ආපසු දෙනුයේ තෝරාගනු ලබන ටෙන්ඩර්කරු සමග ගිවිසුමකට අත්සන් තැබීමෙන් පසුව ය.

10. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් ඇපකරුවන් ඉදිරිපත් කළ යුතුය යි ඔහුට දැනුම් දුන හොත් එසේ කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර හෝ සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ ප්‍රතික්ෂේප කිරීමෙන් පිළිගැනීමෙන් අයිතිය මාතර දිසාපති විසින් තමා වෙත තබාගන්නට යෙදුනා ඇත.

එල්. එන්. ද එල්. බණ්ඩාරනායක,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1959 මැයි මස 4 වැනි දින,
මාතර කච්චේරියේ දීය.

---

හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය තුළ පහත සඳහන් වැසිකිළි හා ගොඩනැගිලි තැනීම පිළිබඳව ටැන්ඩර් පත්‍ර මා විසින් 1959 මැයි මස 28 වෙනි දින පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ.

සිතුල් පව්වේ—

(අ) කාමර 3කින් යුත් වැසිකිළි පේලි 1ක්.

(ආ) කාමර 2කින් යුත් වැසිකිළි පේලි 1ක්.

තිස්සමහාරාමයේ—

(අ) කාමර 3කින් යුත් වැසිකිළි පේලි 2ක්—මැණික් විහාරය ඉදිරිපිට ඉඩමේ.

(ආ) කාමර 8කින් යුත් වැසිකිළි පේලි 3ක්—තිස්ස පොදු වැසිකිළි පිටිපසින්. (පාරේ යන එන අයට නොපෙනෙන අයුරු ආවරණවීම සඳහා අඩි 7ක් උස පොල් අතු පලැල්ලක් සෑදිය යුතුයි).

(ඇ) කාමර 2කින් යුත් වැසිකිළි පේලි 2ක්—වාරිමාර්ග නිලධාරි තැනගේ බංගලාව ඉදිරිපිට.

(ඈ) කාමර 4කින් යුත් වැසිකිළි පේලි 4ක්—තිස්සමහාරාමයේ පන්සල් වත්තේ.

(ඉ) අඩි 30×20 තාවකාලික පොලිස් ගොඩනැගිල්ලක්—තිස්ස පොලිස් ස්ථානය පිහිටි භූමියේ.

2. නියමිත ටැන්ඩර් පත්‍ර ලබාගත යුත්තේ හම්බන්තොට දිසාපති තැනගේ නමින් කච්චේරියේ රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් එම කච්චේරියේ ග්‍රාම පාලන ශාඛාවට 1959.5.27 වන දින සවස 4ට පෙර ඉදිරිපත් කිරීමෙනි. එසේ තැන්පත් කළ මුදල ආපසු ගෙවනු ලබන්නේ තෝරාගනු ලබන ටැන්ඩර්කරු විසින් වැඩකිරීම සඳහා ගිවිසුමකට අත්සන් තැබූ පසුවයි.

3. 1959 මැයි 28 වෙනි දින පෙරවරු 9.30ට උප දිසාපති තැන විසින් ටෙන්ඩර් විවෘත කරනවා ඇත. ටැන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටැන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටීමට පුළුවන.

4. සෑම ටැන්ඩරයක්ම සීල් තබනලද කවරයක එවිය යුතුය. "පොසොන් ගොඩනැගිලි" යන්න එම කවරයේ මුදුනේ වම් කෙළවරේ සඳහන් කළ යුතුයි. එක කවරයක එවිය හැක්කේ එක ටැන්ඩරයක් පමණකි.

5. යම්කිසි ටැන්ඩර්කරුවකු තමන්ගේ ටැන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය නොහැකි නම් එම ටැන්ඩර් පත්‍රය ලියුම් කවරයක බහා සීල් තබා තමන් ඉල්වන වැඩ සහ තමන්ගේ නමද, ලිපිනයද ලියුම් කවරයේ සඳහන් කොට තමන් විසින්ම හෝ තමන්ගේ නියෝජිත තැන විසින් එය උප දිසාපති තැනට භාර දිය යුතුයි.

6. 1959 ජූනි 14 දිනට වැඩ සම්පූර්ණකොට හම්බන්තොට දිසාපති තැනට හෝ ඔහු විසින් පත්කරන නියෝජිතයෙකුට භාර දිය යුතුයි. වැඩ පිළිබඳ සම්පූර්ණ විස්තර හම්බන්තොට කච්චේරියේ ග්‍රාම පාලක ශාඛාවෙන් දැනගත හැක.

7. තෝරාගනු ලබන්නන්ට ටෙන්ඩර්කරු විසින් තමන්ගේ ටැන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක් හම්බන්තොට දිසාපතිගේ නමින් හම්බන්තොට කච්චේරියේ තැන්පත් කළ යුතුයි. නියමිත ලෙස වැඩ සම්පූර්ණ කිරීම සඳහා මෙම තැන්පත් මුදල අවශ්‍ය හෙයින් එසේ මුදල් තැන්පත් කිරීමට සෑම ටෙන්ඩර් කරුවකුම සූදානමව සිටිය යුතුයි. අතරතුර කාලේදී රජයට අය විය යුතු මුදලක් නොවෙතොත් වැඩ අවසාන වූ දින සිට මසකට පසු එම තැන්පත් මුදල ආපසු ගෙවනවා ඇත.

8. කිසිම හේතුවක් නොදන්වා වුවද තමන් වෙත ලැබුණු ටෙන්ඩරයකින් කොටසක්, සම්පූර්ණ ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය හම්බන්තොට දිසාපති තැන සතුව තිබේ.

සී. ඇස්. ඩබ්ලිව්. ගුණවර්ධන,
හම්බන්තොට දිසාපති වෙනුවට.

1959 මැයි 4 දින,
හම්බන්තොට කච්චේරියේ දීය.

---

හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වැඩ පිළිබඳව ටැන්ඩර් පත්‍ර මා විසින් 1959 මැයි මස 28 වෙනි දින පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ :—

තිස්සමහාරාමේ තිබෙන වතුර ටැන්කිය අළුත්වැඩියා කිරීම

2. නියමිත ටැන්ඩර් පත්‍ර ලබා ගත යුත්තේ හම්බන්තොට දිසාපති තැනගේ නමින් කච්චේරියේ රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් එම කච්චේරියේ ග්‍රාම පාලන ශාඛාවට 1959.5.27 වන දින සවස 4ට පෙර ඉදිරිපත් කිරීමෙනි. එසේ තැන්පත් කළ මුදල ආපසු ගෙවනු ලබන්නේ තෝරාගනු ලබන ටැන්ඩර්කරු විසින් වැඩ කිරීම සඳහා ගිවිසුමකට අත්සන් තැබූ පසුවයි.

3. 1959 මැයි මස 28 වෙනි දින පෙරවරු 9.30ට උප දිසාපති තැන විසින් ටෙන්ඩර් විවෘත කරනවා ඇත. ටැන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටැන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටීමට පුළුවන.

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ රුපියල් 3,500 කට වැඩි වටිනාකම ඇති වැඩ කිරීම සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් විය යුතුයි.

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක තැන අනුමත කර තිබෙන ග්‍රාම සංවර්ධන සමිතිවලින් සහ විවිධ සේවා සමුපකාර සමිතිවලින් ද ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටැන්ඩර් පෝරම් ලබා ගැනීමට පෙර කච්චේරියේ රුපියල් 35ක මුදලක් තැන්පත් කොට එම රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි.

ටැන්ඩර් පෝරම් 1959 මැයි මස 20 වැනි දින පස්වරු 3 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබා ගත හැක. ටැන්ඩර් පත්‍ර විවෘත කිරීම 1959 මැයි මස 25 වැනි දින පස්වරු 3 ට රත්නපුර කච්චේරියේදී සිදු කරනු ඇත.

මේ පිළිබඳ තවත් අවශ්‍ය කරුණු රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. කරුණාජීව,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරී තැන,
රත්නපුර දිස්ත්‍රික්කේ දිසාපති තැන වෙනුවට.

1959 අප්‍රේල් මස 29 වැනි දින,
රත්නපුර කච්චේරියේදීය.

---

රත්නපුර දිස්ත්‍රික්කේ නවදුන් කෝරළේ මාරපන යන ගමේ ඉඩම් සංවර්ධන ඕවර්සියර්වරුන්ගේ පදිංචිය සඳහා නිවාස එකක් තැනීම.

රත්නපුර දිස්ත්‍රික්කේ දිසාපති තැන විසින් ඉහත සඳහන් නිවාසයක් තැනීම සඳහා ටැන්ඩර් පත්‍ර 1959 මැයි මස 21 වැනි දින පස්වරු 3 දක්වා භාරගනු ලැබේ. ටැන්ඩර් කරුවන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ රුපියල් 3,500 කට වැඩි වටිනාකම ඇති වැඩ කිරීම සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් විය යුතුයි.

